ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
අංක 3, ශ්‍රී ජයවර්ධනපුර මාවත
වැලිකඩ, රාජගිරිය
දුරකථන : 94 112889485-6,2863705
ෆැක්ස් : 94 112871637

කළමණාකරු

2026-02-11

# ලංසු සඳහා ඇරයුම් කිරීම

මහත්මයාණනි,

**විෂය- යෝජිත අත්තිඩිය ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මැලේෂියන් බෆලෝ වර්ගයේ තණකොළ පිඩලි සැපයීම හා ඇතිරීම සඳහා මිල ගණන් කැඳවීම**

ප්‍රසම්පාදන අංක S/ 14 /26

ලංසුපත් භාර ගැනීම අවසන් වන වේලාව සහ දිනය:-**2026-පෙබරවාරි-23** **ප.ව 1.30**

සාම්පල අවශ්‍ය වේ ☐ ☒ අවශ්‍ය නොවේ

ඇමුණුම් ආකෘතියේ දක්වා ඇති තොරතුරු අනුව ඉහත සඳහන් මැලේෂියන් බෆලෝ වගර්යේ තණකොළ සැපයීම හා ඇතිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

**ලංසුකරුවන්ට උපදෙස්**

1. මෙම ලංසු කැඳවීම සඳහා ලංසුකරු විසින් එක ඉදිරිපත් කිරීමක් පමණක් ලබාදිය යුතු අතර, එය හොඳම ඉදිරිපත් කිරීම විය යුතුය. කිසියම් විකල්ප ලංසුවක් තිබේ නම්, එය මිල ලේඛනයේ ඡායා පිටපතක (එක් විකල්ප ඉදිරිපත් කිරීමකට එක් පිටපතක් භාවිතා කරන්න) සඳහන් කල යුතුය. මේ ආකාරයෙන් ලබා නොදෙන ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. මුළු මිල ගණන් අදාල ආකෘතියට අනුව, වචනයෙන් හා ඉලක්කමින් සඳහන් කල යුතු අතර, මිල ගණන් විවෘත කල දින**2026-පෙබරවාරි-23** සිට දින 49 ක (2026-අප්‍රේල්-13) කාලයක් සඳහා අදාල මිල ගණන් වලංගු විය යුතුය.

3. ලංසුපතේ ඒකක මිල ගණන් වැට් නොමැතිව ශුද්ධ මිල (වට්ටම් අඩු කල අගය) විය යුතුය. එහෙත්, වෙනත් ඕනෑම බදු තිබේ නම් ඒකක මිලට ඇතුලත් කල යුතුය. කරුණාකර ඔබගේ වැට් බදු ලියාපදිංචි අංකය සඳහන් කරන්න. වැට් බදු අංකය සඳහන් නොකරන විට වැට් බදු ගෙවනු නොලැබේ. තවද ලංසු ඇගයීමේදී ඒවායේ වැට් බදු රහිතව ඇගයීම සිදුකරනු ලැබේ. මිල ගණන් වලට ලංසුකරු විසින් සපයනු ලබන සියළුම පහසුකම් වෙතොත් ඒවා මිල ලේඛනයේ සඳහන් කල යුතුය.

4. මිල ලේඛනය ලංසුකරු හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් පුද්ගලයෙකුගේ අත්සන හා නිල මුද්‍රාව සමඟ ඉදිරිපත් කල යුතු වේ.

5. **විෂය- යෝජිත අත්තිඩිය ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මැලේෂියන් බෆලෝ වර්ගයේ තණකොල පිඩලි සැපයීම හා ඇතිරීම සඳහා මිල ගණන් කැඳවීම** යන්න ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි පැහැදිලිව සඳහන් කල යුතුය. **ප්‍රසම්පාදන අංක**: S / **14** /26 ලංසුව අවසන් වන දිනය-**2026-පෙබරවාරි-23 ප.ව. 1.30**

6. ඔබගේ ලංසුපත් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, අංක. 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් පැමිණ ඉහත ලිපිනයේ පිහිටි සැපයුම්

DO NOT COPY

අංශයෙහි තබා ඇති අදාල ටෙන්ඩර් පෙට්ටියට **2026-පෙබරවාරි-23 දින ප.ව. 1.30** ට හෝ ඊට පෙර බහාලිය යුතුය**.**

7. ලංසු සමඟ රු.46,000.00 ක ඇප තැන්පත් මුදල් ඉදිරිපත් කොට තිබිය යුතුය. එම වටිනාකම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මුදල් අයකැමි වෙත ගෙවා එම ලදුපත ඉදිරිපත් කළ හැකිය. එසේ නැතහොත් එම වටිනාකම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් පමණක් ලබාගෙන ඉදිරිපත්කල යුතු අතර, රක්ෂණ ආයතන මගින් ඉදිරිපත් කරන ඇප තැම්පත් සහතික පිළිනොගනී. ඇප තැන්පත් මුදල සඳහා වලංගු කාලය 2026-මැයි-12 වේ.( ලංසු සමග මුල් ලදුපත ඉදිරිපත් කල යුතුය.)

8. **2026-පෙබරවාරි-23 ප.ව. 1.30** ට පෙර ලංසුපත් ඉදිරිපත් කල යුතු වේ. ලංසු විවෘත කිරීම සඳහා සහභාගි වීමට තීරණය කරන ලංසුකරුවන්ට හෝ ලංසුකරුගේ නියෝජිතයෙකුට, ලංසුකරුගේ නිසි අනුමැතිය ලත් ලිපියක් සහ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් ඒ සඳහා සහභාගී විය හැකිය. අදාල ආයතන වලින් එක් නියෝජිතයෙකුට පමණක් ලංසු විවෘත කිරීම සඳහා සහභාගී වීමට අවසර දෙනු ලැබේ.

9. මෙම කොන්ත්‍රාත්තුව සඳහා තාක්ෂණික ඇගයීමේ කමිටුවක් මගින් සුදුසු සැපයුම්කරුවන් තෝරා ගන්නා අතර මිල (නොමිලේ ප්‍රවාහනය සැලකිල්ලට ගනිමින්), අතීත කාර්ය සාධනය සහ සිදුකරන ලද කාර්යයේ ගුණාත්මකභාවය යනාදියද ඇගයීම සඳහා නිර්ණායක වනු ඇත.

10. ඉහත කරුණු වලට අනුකූල නොවන මිල ලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද ඔබ ලංසුවේ ඇති තණපිඩලි සැපයීමේ හා ඇතිරීමේ මුළු ප්‍රමාණයම ලබාදීම, ප්‍රමාණයෙන් කොටසක් ලබා දීම හෝ නොදීම පිළිබඳ පූර්ණ අයිතිය/ බලය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සතුවේ.

11. තණ පිඩලි ඇතිරීම සම්පූර්ණ කල පසු වැඩ පරිමාවට අදාල බිල්පතින් 30% ක මුදලක් ද, පිඩලි අතුරා මාසයකට පසු පොහොර යොදා නිසි නඩත්තුවෙන් පසුව තවත් 40% ක මුදලක්ද, ඉතිරි 30% ක මුදල පිඩලි අතුරා මාස 12 ක කාලසීමාව අවසානයේද ගෙවනු ලැබේ.

12. ඔබ වෙත ලබා දෙනු ලබන කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 5% ක වටිනාකමක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත බලපත්‍ර ලාභී වාණිජ බැංකුවකින් ලබාගත් "කොන්දේසි විරහිත කාර්ය සාධන ඇප බැඳුම්කරයක්" (Unconditional Performance Bond) ඉදිරිපත් කල යුතු අතර එහි වලංගු කාලය කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසුව දින 28ක් (මුළු දින 58) දක්වා පැවතිය යුතුය. එසේ නැතහොත් එම වටිනාකම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මුදල් අයකැමි වෙත ගෙවා එම ලදුපත ඉදිරිපත් කල යුතුය. ඉහත බැඳුම්කරය ප්‍රදාන ලිපිය ලැබී කාර්යාලීය වැඩ කරනු ලබන දින 07 ක් ඇතුලත ඉහත කොන්ත්‍රාත්තුව සංස්ථාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොවනුහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතිය සංස්ථාව සතුවන අතර ලංසුව සමඟ ලබාදුන් ඇප බැඳුම්කරය (Bid Bond) සංස්ථාව සතු වේ.තවද ඉන් අනතුරුව වෙනත් ලංසුකරුවෙකු වෙත ලබා දීමට කටයුතු කරනු ලබයි.

13. තණ පිඩලි ඇල්ලීමට ප්‍රථම උචිත පස් (අවම වශයෙන් අඟල් 02) හා කොහුබත් (අවම වශයෙන් අඟල් 02) අතුරා සුදුසු ලෙස භූමිය සකස් කල යුතුය.

14. තෝරාගත් සැපයුම්කරු විසින් 10’x10’ ප්‍රමාණයේ වගර්ඵලයක අනුමත තණ පිඩලි නිසි පරිදි අතුරා ඒ සඳහා වැඩබිම් ඉංජිනේරුගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

15. තණ පිඩලි ඇල්ලීමේදී හිඩැස් ඇති නොවන පරිදි ඇතිරිය යුතුය. තණ පිඩලි අතර හිඩැස් පැවතුනහොත් ගෙවීම් සිදුකිරීමේදී එම ප්‍රදේශ සඳහා ගෙවීම් අඩු කරනු ලබයි.

16. හානි වූ පැළ නැවත රෝපණය, වල් පැළ ඉවත් කිරීම, වතුර දැමීම, පොහොර දැමීම, තණකොළ කැපීම යනාදි කායර්යන් නඩත්තු කාලසීමාව තුල වැඩබිම් ඉංජිනේරු මහතාගේ අධීක්ෂණයට යටත්ව සිදුකල යුතු අතර ඒවා ලොග් පොතක සටහන් කල යුතුය.

17. කොන්ත්‍රාත් කාලය නඩත්තු කාල සීමාවත් සමඟ පහත පරිදි මාස 13 ක් වේ.

- තණ පිඩලි සැපයීමේ හා ඇතිරීමේ කාලසීමාව 2026 අප්‍රේල් 01 සිට 2026 අප්‍රේල් 30 (මාස 01)
- තණ පිඩලි නඩත්තු කාලසීමාව 2026 අප්‍රේල් 30 සිට 2027 අප්‍රේල් 30 (මාස 12)

18. කොන්ත්‍රාත්කරු තණ පිඩලි අල්ලා අවසන් වීමෙන් පසු පහත කොන්දේසි වලට යටත්ව නඩත්තු ගිවිසුමක්ද අත්සන් කල යුතු වේ.

**I.** නඩත්තු කාල සීමාව තණ පිඩලි අල්ලා අවසන් වූ දින සිට වසරක (මාස 12) කාල සීමාවක් වේ.

**II.** කොන්ත්‍රාත්කරු විසින් තණ පිඩලි අල්ලා අවසන් වූ පසු දෛනිකව (වර්ෂාව නොමැති දිනයන්හි) තණ පිඩලි වලට වතුර දැමීම සිදුකල යුතුය.

**III.** කොන්ත්‍රාත්කරු විසින් කාර්යය නිමකල පසු අවම වශයෙන් මාස දෙකකට වරක් තණ පිඩලි වලට පොහොර දැමීම සිදුකල යුතුය.

**IV.** සුදුසු කාලවලදී තණකොළ කපා වල් පැළ ඉවත් කොට නඩත්තු කටයුතු සිදුකල යුතුය.

**V.** ඉහත කායර්යන් සිදුකිරීමේදී ඒවා ලොග් පොතක සටහන් කල යුතුය.

**VI.** ඉහත සියළුම කායර්යන් වැඩබිම් භාර ඉංජිනේරු මහතාගේ අධීක්ෂණයට යටත්ව සිදුකල යුතුය.

**VII.** එසේම ඉහත කායර්යන් පැහැර හරින අවස්ථාවන්හිදී එක් දිනක් සඳහා රු. 2,000/- බැගින් අවසන් බිල්පතින් අඩු කරනු ලැබේ.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්)**

DRAFT

විෂය - <u>යෝජිත අත්තිඩිය ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මැලේෂියන් බෆලෝ වර්ගයේ තණකොළ පිඩලි සැපයීම හා ඇතිරීම සඳහා මිල ගණන් කැඳවීම</u>

<u>ප්‍රසම්පාදන අංක S/ 14/26</u>

## <u>මිල ලේඛනය</u>

ලංසුව අවසන් වන වේලාව සහ දිනය -**<u>2026-පෙබරවාරි-23</u>** ප.ව 1.30

ඉල්ලුම් පත්‍ර අංක : ලිපිය


**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**
අංක 3, ශ්‍රී ජයවර්ධනපුර මාවත
වැලිකඩ, රාජගිරිය
**දුරකථන :** 94 112889485-6,2863705
**ෆැක්ස් :** 94 112871637


<table>
<tr><th>1</th><th>2</th><th>3</th><th>4</th><th>5</th><th>6</th><th>7</th><th>8</th><th>9</th></tr>
<tr><td>අයිතම අංකය</td><td>ප්‍රමාණය</td><td>ඒකකය</td><td>අයිතම විස්තරය</td><td>වැඩබිම</td><td>තොග සන්තක ප්‍රමාණය (තොග සන්තක ප්‍රමාණය නොඑසේ නම් ලබාදිය හැකි කාල සීමාව සඳහන් කරන්න</td><td>ප්‍රවාහන රක්ෂණය සහ වෙනත් අදාළ සේවා සඳහා ගාස්තු</td><td>ඒකකයක මිල (එකතු කල අගය මත බදු අනෙකුත් බදු හැර )</td><td>මුළු මුදල (රු)</td></tr>
<tr><td>01</td><td>10,000</td><td>වර්ග මීටර</td><td>මැලේෂියන් බෆලෝ තණකොළ (Malaysian Buffalo Grass</td><td>අත්තිඩිය ක්‍රීඩා පිටිය</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td colspan="3" rowspan="3">සපුරාලිය යුතු භාණ්ඩ සඳහා විශේෂ සටහන්</td><td colspan="3" rowspan="3"><ul><li>තණ පිඩලි ඇල්ලීමට ප්‍රථම උචිත පස් (අවම වශයෙන් අඟල් 02) හා කොහුබත් (අවම වශයෙන් අඟල් 02) අතුරා සුදුසු ලෙස භූමිය සකස් කල යුතුය.</li><li>කොන්ත්‍රාත් කාලය නඩත්තු කාල සීමාවත් සමඟ පහත පරිදි මාස 13 ක් වේ.<ul><li>තණ පිඩලි සැපයීමේ හා ඇතිරීමේ කාලසීමාව 2026 අප්‍රේල් 01 සිට 2026 අප්‍රේල් 30 (මාස 01)</li><li>තණ පිඩලි නඩත්තු කාලසීමාව 2026 අප්‍රේල් 30 සිට 2027 අප්‍රේල් 30 (මාස 12)</li></ul></li><li>තෝරාගත් සැපයුම්කරු විසින් 10’x10’ ප්‍රමාණයේ වගර්ඵලයක අනුමත තණ පිඩලි නිසි පරිදි අතුරා ඒ සඳහා වැඩබිම් ඉංජිනේරුගේ අනුමැතිය ලබා ගත යුතු වේ.</li><li>තණ පිඩලි ඇල්ලීමේදී හිඩැස් ඇති නොවන පරිදි ඇතිරිය යුතුය. තණ පිඩලි අතර හිඩැස් පැවතුනහොත් ගෙවීම් සිදුකිරීමේදී එම ප්‍රදේශ සඳහා ගෙවීම් අඩු කරනු ලබයි.</li><li>හානි වූ පැළ නැවත රෝපණය, වල් පැළ ඉවත් කිරීම, වතුර දැමීම, පොහොර දැමීම, තණකොළ කැපීම යනාදි කායර්යන් නඩත්තු කාලසීමාව තුල වැඩබිම් ඉංජිනේරු මහතාගේ අධීක්ෂණයට යටත්ව සිදුකල යුතු අතර ඒවා ලොග්</li></ul></td><td colspan="2">මුදල ( රු)</td><td></td></tr>
<tr><td colspan="2">18% වැට් අගය ( රු)</td><td></td></tr>
<tr><td colspan="2">මුළු මුදල (වැට් සහිතව-( රු)</td><td></td></tr>
</table>

<table>
<tr><td></td><td>පොතක සටහන් කල යුතුය.<br>• තණ පිඩලි ඇතිරීම සම්පූණර් කල පසු වැඩ පරිමාවට අදාල බිල්පතින් 30% ක මුදලක් ද, පිඩලි අතුරා මාසයකට පසු පොහොර යොදා නිසි නඩත්තුවෙන් පසුව තවත් 40% ක මුදලක්ද, ඉතිරි 30% ක මුදල පිඩලි අතුරා මාස 12 ක කාලසීමාව අවසානයේද ගෙවනු ලැබේ.<br>• කොන්ත්‍රාත්කරු තණ පිඩලි අල්ලා අවසන් වීමෙන් පසු පහත කොන්දේසි වලට යටත්ව නඩත්තු ගිවිසුමක්ද අත්සන් කල යුතු වේ.<br>I. නඩත්තු කාල සීමාව තණ පිඩලි අල්ලා අවසන් වූ දින සිට වසරක (මාස 12) කාල සීමාවක් වේ.<br>II. කොන්ත්‍රාත්කරු විසින් තණ පිඩලි අල්ලා අවසන් වු පසු දෛනිකව (වර්ෂාව නොමැති දිනයන්හි) තණ පිඩලි වලට වතුර දැමීම සිදුකල යුතුය.<br>III. කොන්ත්‍රාත්කරු විසින් කාර්යය නිමකල පසු අවම වශයෙන් මාස දෙකකට වරක් තණ පිඩලි වලට පොහොර දැමීම සිදුකල යුතුය.<br>IV. සුදුසු කාලවලදී තණකොළ කපා වල් පැළ ඉවත් කොට නඩත්තු කටයුතු සිදුකල යුතුය.<br>V. ඉහත කායර්යන් සිදුකිරීමේදී ඒවා ලොග් පොතක සටහන් කල යුතුය.<br>VI. ඉහත සියළුම කායර්යන් වැඩබිම් භාර ඉංජිනේරු මහතාගේ අධීක්ෂණයට යටත්ව සිදුකල යුතුය.<br>VII. එසේම ඉහත කායර්යන් පැහැර හරින අවස්ථාවන්හිදී එක් දිනක් සඳහා රු.2,000/- බැගින් අවසන් බිල්පතින් අඩු කරනු ලැබේ.</td><td></td><td></td></tr>
<tr><td colspan="4">අකුරෙන් සම්පූණර් මිල</td></tr>
<tr><td>VAT ලියාපදිංචි අංකය</td><td colspan="2"></td><td rowspan="2">ඉහත සඳහන් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ඔබ විසින් නියම කරන ලද සියලුම කොන්දේසි යටතේ ඉහත භාණ්ඩ සැපයීමට අපි එකඟ වෙමු.<br><br>.....................................................<br>බලයලත් පුද්ගලයාගේ අත්සන</td></tr>
<tr><td>සමාගමේ නම සහ ලිපිනය</td><td></td><td>ඇමතිය යුතු පුද්ගලයා නම.<br><br>.......................................<br>දුරකථන අංක හා විද්‍යුත් තැපැල<br>.................................................</td></tr>
</table>

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්)**

DO NOT COPY

DO NOT COPY